*සැ. යු.* - 2016.12.30 වැනි දින පළ වූ අංක 2000 දරන *ගැසට් පත්‍රයේ* I : II (අ), III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,001 - 2017 ජනවාරි මස 06 වැනි සිකුරාදා - 2017.01.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් | 16 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — |
| බඩු බාහිරාදිය විකිණීම් | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් | — |
| රජයේ නොවන දැන්වීම් | 16 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් | 21 |

*සැ. යු.* -(i) ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත 2016 දෙසැම්බර් මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 ජනවාරි මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 ජනවාරි මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන නිවේදනය සංශෝධනය කිරීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා බෙල් ඇන්ඩ් ලයිට් ලෙවල් ක්‍රොසිං 200ක් සපයා, සවිකර, පරීක්ෂාකර, ක්‍රියාකර පෙන්වීම සඳහා වන ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංකය : SRS/F.7410

01. 2016.11.18 වැනි දින පළකරන ලද අංක 1994 *ගැසට් පත්‍රයේ* 11-823 දැන්වීම හා බැඳේ.

02. ශ්‍රී ලංකාවේ, බත්තරමුල්ල, සෙත්සිරිපාය අදියර II හි 7 වැනි මහලෙහි ප්‍රවාහන සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයෙහි, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් ලංසු නිකුත්කරන සහ ලංසු භාරගන්නා වූ අවසාන දිනය සහ ලංසු විවෘත කරන අවසන් දිනයන් පහත සඳහන් පරිදි දීර්ඝ කර ඇත.

* ලියකියවිලි නිකුත් කරන අවසාන දිනය : 2017.01.19
* ලංසු භාරගනු ලබන අවසාන දිනය/ලංසු විවෘත කරන දිනය : 2017.01.20

03. වැඩිදුර විස්තර සඳහා මෙසේ විමසන්න -

දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347, ඕල්කට් මාවත,
කොළඹ 10.
දුරකථන අංක : 94(11) 2438078/2436818
ෆැක්ස් අංකය : 94 (11) 2432044
ඊමේල් : srs.slr@gmail.com

යොමු අංකය : SRS/F.7410

සභාපති,
අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද
ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය.

01-76

# රජයේ නොවන දැන්වීම්

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

ගාල්ල, මාගාල්ල, මාතර පාර, අංක 233 හි පදිංචි අන්තෝනිගේ ප්‍රේමලාල් සහ ප්‍රැන්සිස්කු බදුගේ සන්ධ්‍යා රෝහිණී වන අප විසින් ගාල්ල, මාගාල්ල, මාතර පාර, අංක 233 හි පදිංචි අන්තෝනිගේ ප්‍රේමසිරි අපගේ ඇටෝර්නි බලකරු කරමින් ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වන පී. කේ. එල්. බණ්ඩාර යන අය විසින් වර්ෂ 2008.05.23 වැනි දින ලියා සහතික කරන ලද අංක 4730 දරන ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2016ක් වූ දෙසැම්බර් මස 20 වැනි දින සිට අවලංගු කරන බැව් මෙමගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවට හා මහජනතාවට දන්වා සිටිමි.

තව ද, ඉහත කී ඇටෝර්නි බලකරු වන අන්තෝනිගේ ප්‍රේමසිරි යන අය විසින් අප වෙත හෝ අප වෙනුවෙන් කරන ලද කිසිම ක්‍රියාවකට වර්ෂ 2016ක් වූ දෙසැම්බර් මස 20 වැනි දිනෙන් පසුව අප විසින් වග නොකියන බව ද ප්‍රකාශ කර සිටිමි.

අන්තෝනිගේ ප්‍රේමලාල්,
ප්‍රැන්සිස්කු බදුගේ සන්ධ්‍යා රෝහිණී.

01-04

**ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම**

පන්නිපිටිය, පරණ පාර, අංක 68 දරන ස්ථානයේ පදිංචි නිමල් බෙනඩික් පානබොක්ක වන මම, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩී. ආර්. මෙන්ඩිස් විසින් වර්ෂ 2005ක් වූ ජුනි මස 14 වන දින ලියා සහතික කරන ලද අංක 2275 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය ප්‍රකාරව මහනුවර, රජ වීදිය, අංක 84 දරන ස්ථානයේ පිහිටි සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පනි ලිමිටඩ් හි අධ්‍යක්ෂවරුන් වන චන්ද්‍රා විජේනායක, එරංජිත් හරේන්ද්‍ර විජේනායක, ස්ටැන්ලි වින්සන්ට් වනිගසේකර, ජෙරල්ඩ් ෂමිල් නිරංජන් පීරිස්, මහනාගගේ සිදන්ත විජේනායක, උදය ලංකාධිකාරි කදුරුගමුව, ගාමිණී ක්‍රිස්ටෝපර් බර්නාඩ් විජයසිංහ, රවීන්ද්‍ර අර්ල් රඹුක්වැල්ල සහ අර්ජුන ගුණරත්න යන අය වෙත පවරන ලද සියලුම බලතල සහ වගකීම් අද දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් අවලංගු කරන අතර, මෙයින් මතු එකී ඇටෝර්නි බලපත්‍රය මත ඉහත නම් සඳහන් අයවලුන් විසින් කරනු ලබන සියලුම ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මා විසින් කිසියම් හෝ වගකීමක් දැරීමට බැඳී නොමැති බවත්, ශ්‍රී ලංකාවාසී සියලු දෙනාට ම මෙයින් දැනුම් දෙමි.

එන්. බී. පානබොක්ක.

01-349

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බලපිටිය, දුම්රියපොළ පාර, අංක 72 හි පදිංචි නන්එදිරි දමයන්ති වන මා විසින් බලපිටිය, දුම්රියපොළ පාර, අංක 72 හි පදිංචි, හක්කිනි අතුල විජයලාල් ද සිල්වා මාගේ ඇටර්නි බලකරු ලෙස පත්කරමින් පිළියෙල කළ බලපිටිය ප්‍රසිද්ධ නොතාරිස් රුවන්පුර සැම්සන් ප්‍රේමරත්න ද සිල්වා විසින් ලියා සහතික කරන ලද 2007.08.29 දිනැති අංක 443 දරන ඇටර්නි බලපත්‍රය, වර්ෂ 2016ක් වූ දෙසැම්බර් මස 06 වැනි දින සිට බල පැවැත්වෙන සේ මෙයින් අවලංගු කර, ප්‍රත්‍යාදිෂ්ඨ කර මින්මතු එකී ඇටර්නි බලකරු විසින් කරනු ලබන කිසිම ක්‍රියාවකට මා වගනොකියන බව ද ශ්‍රී ලංකා ජනරජය වෙත මෙයින් දැනුම් දෙමි.

නන්එදිරි දමයන්ති.

2016 දෙසැම්බර් මස 08 වැනි දින,
අංක 72, දුම්රියපොල පාර,
බලපිටිය.

01-13

---

## 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති 9 (1) ට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම.

සමාගමේ නම : ජෙම් ෆෝ ඒ රෙක්රූට්මන්ට් ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 110321
සංස්ථාපනය කළ දිනය : 2015.12.08
සමාගමේ ලිපිනය : අංක 202/1, මහබුත්ගමුව පාර, කොටිකාවත්ත.

ලේකම්.

01-14

---

## 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති 9 (1) ට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම.

සමාගමේ නම : ඩෙල්කා සිමෙන්ට් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 114670
සංස්ථාපනය කළ දිනය : 2016.06.28
සමාගමේ ලිපිනය : 270/29/1, දඹුල්ල පාර, අඹන්පොල, කුරුණෑගල.

ලේකම්.

01-15

## නිවේදනයයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම : තර්ඩ් අයි සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 108883
ලියාපදිංචි ලිපිනය : අංක 1117/2, ධම්මෝදය මාවත, මිහිඳුපුර, බත්තරමුල්ල.

අධ්‍යක්ෂ.

01-43

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පහත සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : එලිගන්ට් හෝල්ඩිංස් (පී. වී. ටී.) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 118365
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 16 ඒ, ගැමුණු මාවත, කිරිබත්ගොඩ.

අධ්‍යක්ෂ.

01-48

---

## සමාගම් නාමය වෙනස් කිරීම සම්බන්ධව ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය අනුකූලව පහත සඳහන් සමාගමේ නාමය 2016 සැප්තැම්බර් මස 15 වැනි දින සිට පහත සඳහන් පරිදි වෙනස් කරන ලද බව මෙසේ නිවේදනය කරනු ලැබේ.

සමාගමේ පෙර නම : ලාෆාජ් මහවෙලි සිමෙන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
නව සමාගම් නාමය : මහවැලි මෙරින් සිමෙන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 4478
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 413, ආර්. ඒ. ද මැල් මාවත, කොළඹ 03.

එස්. එස්. පී. කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2016 සැප්තැම්බර් මස 26 වැනි දින.

01-46

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : කිංග්ස් හෙවන් හොලිඩේස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 117896
ලියාපදිංචි ලිපිනය : අංක 179/3, රාජසිංහ පාර, මීනුවන්ගොඩ.

අධ්‍යක්ෂවරු.

01-54

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : රිනීවබල් එනර්ජි මෝල්ඩිව්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 117637
ලියාපදිංචි ලිපිනය : අංක 60/15, බෝගහහේන පාර, බත්තරමුල්ල.

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
පී. වී. 5958

01-56/1

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ද එක්සකටිව් සෙන්ටර් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 118088
ලියාපදිංචි ලිපිනය : අංක 40, ගෝල්ෆේස් කෝට් 02, කොළඹ 03.

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
පී. වී. 5958

01-56/2

---

## දැනුම්දීමයි

එස් කේ ඉන්වෙස්ට්මන්ට්ස් ලංකා ( ප්‍රයිවට්) ලිමිටඩ්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව නාමය වෙනස්කර 9(2) උපවගන්තිය ප්‍රකාරව පහත පරිදි දැනුම් දෙයි:

සමාගමේ පෙර නාමය : එස් කේ ඉන්වෙස්ට්මන්ට්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 16724
ලියාපදිංචි ලිපිනය : 18 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.
සමාගමේ නව නාමය : ඕවර්සීස් රියල්ටි ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

බී. එම්. එස්. ප්‍රනාන්දු මිය,
සමාගම් ලේකම්.

01-73

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9(1) වගන්තියට අනුව පහත දක්වෙන ආයතන සීමාසහිත සමාගම් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ඒරන් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 511/7, ගාලු පාර, රාවතාවත්ත, මොරටුව
ලියාපදිංචි අංකය : පී වී 116991,
ලියාපදිංචි දිනය : 2016.10.05

සමාගමේ නම : ජයලත් ස්ටීල් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 213/1, මාලපල්ල, කොට්ටාව
ලියාපදිංචි අංකය : පී වී 117699
ලියාපදිංචි දිනය : 2016.11.01

සමාගමේ නම : එක්සැම් ජීනියස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : ලෙවල් 5, 370, හයිලෙවල් පාර, පන්නිපිටිය
ලියාපදිංචි අංකය : පී වී 118324
ලියාපදිංචි දිනය : 2016.11.25

කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-87

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කුරුවිට, එක්නැලිගොඩ, ගුරුළුවාන පාර, අංක 802 හි පදිංචි අංක 745852262 වී දරන ජාතික හැඳුනුම්පත හිමි මිල්ලගස්තැන්නලාගේ රේණුකා ප්‍රියංගනී වන මා විසින් ප්‍රදනය කරන ලද කුරුවිට, මලව, 9 1/2 වත්ත, සමනල පෙදෙස, අංක 472 ඒ 01 හි පදිචි අංක 676873708 වී දරන ජාතික හැඳුනුම්පත හිමි රංගල්ලගේ සිරිමාවතී යන අය වෙනුවෙන් සකස් කරන ලද පරාක්‍රම එස්. ශ්‍රී වික්‍රමරත්න නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්, අංක 66, සිරිවර්ධන පාර, හොරපේ, රාගම යන අය විසින් සහතික කරන ලද අංක 155 සහ 2014.06.03 දින දරන ඇටෝර්නි බලපත්‍රය 2016.11.14 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරන ලද සහ නිශ්ප්‍රභා කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ ශ්‍රී ලංකාවාසී මහජනතාවට මෙයින් දැනුම් දෙන අතර, මින් ඉදිරියට මෙම ඉහත කී ඇටෝර්නි බලපත්‍රය යටතේ කරනු ලබන යම් ක්‍රියාවක් හෝ ලියවිල්ලක් සම්බන්ධයෙන් වග නොකියමි.

මිල්ලගස්තැන්නලාගේ රේණුකා ප්‍රියංගනී.

01-92

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

පැරණි නම : අම්බා රිසර්ච් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 1353
ලියාපදිංචි ලිපිනය : 32 වන මහල, වෙස්ට් ටවර්, වර්ල්ඩ් ට්‍රේඩ් සෙන්ටර්, එච්ලන් ස්ක්වෙයාර්, කොළඹ 01
අලුත් නම : මූඩීස් ඇනලිටික්ස් නොලේජ් සර්විසස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පීවී 5958

01-100

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනත 9 (1) වගන්තිය ප්‍රකාරව මෙල්ස්ටා හෙල්ත් (ප්‍රයිවට්) ලිමිටඩ් පෞද්ගලික සීමිත වගකීම් සමාගමක් ලෙස 2016 දෙසැම්බර් මස 09 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : මෙල්ස්ටා හෙල්ත් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 118630
ලියාපදිංචි ලිපිනය : අංක 110, නොරිස් කැනල් පාර, කොළඹ 10

වී. ජේ. සේනාරත්න මෙනෙවිය,
සමාගම් ලේකම්.

01-115

---

## මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව, ට්‍රාන්ස්පෝර්ට් කන්සාල්ටන්සි ඇන්ඩ් ට්‍රේනින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2015 මාර්තු මස 17 වැනි දින සිට ලියාපදිංචි කොට ඇති බව මහජනයා වෙත කරන නිවේදනයයි.

සමාගමේ නම : ට්‍රාන්ස්පෝර්ට් කන්සාල්ටන්සි ඇන්ඩ් ට්‍රේනින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 164/4, බෝපේ, ගාල්ල
සමාගමේ අංකය : පීවී 83925

එම්. එස්. එස්. පෙරේරා,
සමාගම් ලේකම්.

01-124

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ත්‍රිත්ව ලංකා මැෂිනරි (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කරන ලද දිනය : 2016 නොවැම්බර් මස 11 වැනි දින
අංකය: පී වී 118011
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 2 වන මහල, අංක 275, නාවල පාර, නාවල, කෝට්ටේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. ආර්. සෙකටේරියල් සර්විසස් (පුද්.) සමාගම,
අධ්‍යක්ෂ.

01-134

---

## සමාගම් සංස්ථාගත කිරීමේ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : වැලියු සෝර්ස් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 14 , කාසල් පටුමග, කොළඹ 4
සමාගමේ අංකය : පී වී 117716
සංස්ථාගත කරන ලද දිනය : 2016.11.04

සී/ස සීජ්එස් කෝපරේට් සර්විසස් (පුද්.) සමාගම,
ලේකම්වරු.

01-135

---

## සමාගම් සංස්ථාගත කිරීමේ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ඊසිබුකිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 286-1/1, ගාලු පාර, ගල්කිස්ස
සමාගමේ අංකය : පී වී 117851
සංස්ථාගත කරන ලද දිනය : 2016.11.07

සී/ස සීජ්එස් කෝපරේට් සර්විසස් (පුද්.) සමාගම.
ලේකම්වරු.

01-136

**සමාගමේ නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 8(1) A 2 වගන්තීන්ට ප්‍රකාරව හා එයට අනුකූලතාව ඇතිව මෙහි පහත දක්වෙන ආකාරයට සමාගමේ නාමය වෙනස් කොට සමාගම් ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයා යටතේ ලියාපදිංචි කර ඇති බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ පෙර පැවති නාමය : වේදන්ත කොමොඩිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 72041
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 38, ගෝල් පේස් කෝර්ට් 02, කොළඹ 03
සමාගමේ නව නාමය : මොනරාගල පේපර් බෝඩ්ස් ප්‍රයිවට් ලිමිටඩ්
නාමය වෙනස් කිරීම බලාත්මක වන දිනය : 2016 සැප්තැම්බර් මස 13 වැනි දින.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මයිඩැස් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

01-142

---

**දැන්වීමයි**

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත විස්තර සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ස්කයි ඉන්ටනැෂනල් ලංකා (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : PV 83622
ලියාපදිංචි කාර්යාලය : අංක 542/3, මීගමු පාර, වත්තල.

සමාගම් ලේකම්.

01-143

---

**ඇටර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම**

මෙහි පහත අත්සන් තබන ශ්‍රී ලංකා ජනරජයේ බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල, අප්පුගෙවත්ත, අංක 29 දරන තැන පදිංචි ඇල්පෙනේලිස්ගේ ශාන්ති විජේවීර වන මා විසින් බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල, අප්පුගෙවත්ත, අංක 29/1 හි පදිංචි කට්ටඩිගේ සියදෝරිස් සිරිල් ජයන්ත අය අයට ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජී. ආර්. ජයවික්‍රම මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 59 සහ 2011.07.02 දින දරන ඇටර්නි බලපත්‍රය අද දින පටන් බලපාන පරිදි අවලංගු කර විසුරුවා හරින බවත්, අද දින සිට එකී ඇටෝර්නි බලපත්‍රයේ ඔහුට ලබා දී ඇති බලය අවලංගු කරන බවට ලංකාවේ පුරවැසියන්ට මෙයින් දැනුම් දෙමි. මෙම ඇටෝර්නි බලපත්‍රය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 20 වන පොතේ 11 වන පත් ඉරුවේ 9994 ඡේදය යටතේ ලියාපදිංචි කර ඇති බවත් ය.

ඉහත කී අංක 59 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් ඉහත නම් සඳහන් කට්ටඩිගේ සියදෝරිස් සිරිල් ජයන්ත නමැති අය විසින් අද දින සිට කරනු ලබන කිසිදු ගනුදෙනුවකට හෝ කටයුතුවලට මා වගකීම් බාර නොගන්නා බවට මෙයින් දන්වා සිටිමි.

ඒ බවට,

ඇල්පෙනේලිස්ගේ ශාන්ති විජේවීර.

2016 ඔක්තෝබර් මස 29 වැනි දින.

01-151

---

**ඇටෝර්නි බලය අවලංගු කිරීම**

හම්බන්තොට, ලේවාය, එගොඩාන, ආරබොක්ක පාරේ අංක 27 හි ජා. හැ. ප. අංක 682800437 V හිමි තුවාන් නූර් ආසිර් වන මම හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අබ්දුල් හමීඩ් මොහොමඩ් මර්සූක් ප්‍රසිද්ධ නොතාරිස් මහතාගේ 2016.07.06 දිනැති අංක 1924 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් හම්බන්තොට, ලේවාය එගොඩාන, ආරබොක්ක පාරේ අංක 27 පදිංචි ජා. හැ. ප. අංක 708231886 V සාබ්දීන් දවුලත් කදීරා හෙවත් දවුලත් නදීරා යන අයට පවරන ලද විශේෂ ඇටෝර්නි බලය මෙයින් අවලංගු කරන අතර එකී ඇටෝර්නි බලපත්‍රය මත කිසිදු කාර්යයක් මින්මතු වලංගු නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ආණ්ඩුව සහ මහජනයා වෙත දන්වා සිටිමි.

තුවාන් නූර් ආසිර්.

2016 නොවැම්බර් මස 08 වැනි දින.

01-162

---

**නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : වර්ක්ෆෝර්ස් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 118692
සංස්ථාගත කළ දිනය : 2016.12.07
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 202, කලාප 7, මිලේනියම් සිටි, අතුරුගිරිය.

හෙට්ටි ආරච්චි මතුකන්දගේ දයාරත්න,
සමාගම් ලේකම්.

අංක 705/22, කොරතොට - උතුර,
කඩුවෙල.

01-191

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

| *සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය* |
| --- | --- | --- | --- |
| 1. ඒ. අයි. එස්. ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 118751 | 2016.12.16 | අංක 86 1/37, කේසර් වීදිය, කොළඹ 11 |

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-132

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ඩී එෆ් සී සී බැංකුව පී එල් සී**
(ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී හි අනුප්‍රාප්තික)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 1048 සහ 518/781/101 සහ 569/225/821 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පස්දුන් කෝරළයේ, උතුරු මහ පත්තුවේ, අගලවත්ත ප්‍රාදේශීය සභා සීමාවට අයත්, අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හල්ලෝවිට අංක 827/B ග්‍රාම නිලධාරි වසමේ පිඹුරේ පිහිටි, ''මැද්දෙගේවත්ත උඩකට්ටිය'' සහ ''තම්බගොඩ කැලේ'' ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු ඩබ්. එල්. ෆොන්සේකා විසින් සාදන ලද 2011 ජනවාරි මස 25 වැනි දිනැති අංක 4223 දරන පිඹුරේ දක්වෙන සීමා නිර්ණය කර බෙද වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 34 රූඩ් 03 පර්. 06

එහි පිහිටි පස, රබර් වගාවන් ලියාපදිංචි අංක 828/E 4/TL 11 දරන රබර් පාලක කාර්යාලය, නිවාස දෙක අනෙකුත් ගොඩනැගිලි සහ සියල්ල සහිතව මතුගම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් ජීවනී වීරසේන විසින් සහතික කරන ලද 2012 ජුනි මස 13 වැනි දිනැති අංක 1048 දරන පිළිවෙලින් කළුතර ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. ඒ. ටී. අල්විස්, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී පී ඩබ් මීගහවෙල සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. රණතුංග යන අය විසින් සහතික කරන ලද 2013 ජුනි මස 20 වැනි දිනැති, 2013 ජූලි මස 01 වැනි දිනැති සහ 2013 ජූලි මස 03 වන දිනැති අංක 518/781/101 දරන සහ පිළිවෙලින් කළුතර ප්‍රසිද්ධ ඩී ඩී ඒ ටී අල්විස් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. රණතුංග සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. ඩබ්. මීගහවෙල යන අය විසින් සහතික කරන ලද 2013 ඔක්තෝබර් මස 14 වන දිනැති, 2013 ඔක්තෝබර් මස 28 වන දිනැති සහ 2013 ඔක්තෝබර් මස 30 වන දිනැති අංක 569/225/821 දරන උකස්කරයන් ප්‍රකාර, බදුරලියේ ''අශාන් රබර් කර්මාන්තශාලාව'' නම් තනි පුද්ගල ව්‍යාපාරය පවත්වාගෙන යන සන්ජය අශාන් ගලබොඩ විසින් ඩී එෆ් සී සී බැංකුව පී එල් සී (ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී හි අනුප්‍රාප්තික) ට උකස් කරන ලදුව, ගෙවීම්වලදී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව පී එල් සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2017 ජනවාරි මස 24 වැනි දින (අඟහරුවාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීමේ ක්‍රමය.- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2%(සියයට දෙකහමාර),
4. රු. 94,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පී එල් සී හි නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011- 2371371.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ /අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 125 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

01-08

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මහනුවර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඉතා වටිනා ව්‍යාපාරික දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහනුවර මහ නගර සභා සීමාවන් තුළ ඩී. එස්. සේනානායක වීදිය (පෙර ත්‍රිකුණාමල වීදිය) හි පිහිටි ඉතා වටිනා සියලු පහසුකම් සහිත මහල් ගොඩනැගිල්ලක් හා එහි සියලු දේ.
ඉඩමේ ප්‍රමාණය : පර්චස් 6.60 (වරිපනම් අංක 148-148 1/1)

මෙම දේපළ මුහම්දිරම් රාලලාගේ යශ්මින් ධම්මික බණ්ඩාර යන අය බන්ධනදයි වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණයපහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.* - මහනුවර නගර මධ්‍යයේ සිට දළද වීදිය ඔස්සේ රැජිණ හෝටලය (Queens Hotel) දක්වා පැමිණ මෙහිදී වමට හැරී ඩී. එස්. සේනානායක වීදියට (මින් පෙර ත්‍රිකුණාමල වීදිය) පිවිස මීටර් 500ක් පමණ ගමන් ගත් විට මෙම පාරේ දකුණු පසින් පාරට මායිම්ව පිහිටා තිබේ.

2017ක් වූ ජනවාරි මස 27 වැනි දින පෙ. ව. 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.11.25 දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2016.11.30 දින ඩේලිමිරර්, ලක්බිම හා තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු , අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011- 2661835, 011- 2661836.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක 081-2210595/071-4962449/071-8446374.

01-94

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මහනුවර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඉතා වටිනා ව්‍යාපාරික දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහනුවර මහ නගර සභා සීමාවන් තුළ ඩී. එස්. සේනානායක වීදිය (පෙර ත්‍රිකුණාමල වීදිය) හි පිහිටි ඉතා වටිනා මහල් ගොඩනැගිල්ල ඇතුළු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 17.59 (වරිපනම් අංක 142, 144, 146 ඩී. එස්. සේනානායක වීදිය)

මෙම දේපළ මුහම්දිරම් රාලලාගේ යශ්මින් ධම්මික බණ්ඩාර යන අය බන්ධනදයි වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණයපහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.* - මහනුවර නගර මධ්‍යයේ සිට දළද වීදිය ඔස්සේ රැජිණ හෝටලය (Queens Hotel ) දක්වා පැමිණ මෙහිදී වමට හැරී ඩී. එස්. සේනානායක වීදිය (මින් පෙර ත්‍රිකුණාමල වීදිය) පිවිස මීටර් 500ක් පමණ ගමන් ගත් විට මෙම දේපළ පාරේ දකුණු පසින් පාරට මායිම්ව පිහිටා තිබේ.

2017ක් වූ ජනවාරි මස 27 වැනි දින පෙ. ව. 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.11.25 දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2016.11.30 දින ඩේලිමිරර්, ලක්බිම හා තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු , අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011- 2661835, 011- 2661836.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක 081-2210595/071-4755974/071-8446374/ 077-7761706.

01-95

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - බොරැල්ල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු දෙමහල් නිවසක් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාවන් තුළ රාජගිරිය ඔබේසේකරපුර නානායක්කාර මාවත තුළ ගෝතමී ගාඩ්න්ස් හි පිහිටි තුඩුවේකුඹුර නමැති ඉඩමට බලයලත් මානක එස්. ලෝකනාතන් විසින් 1999.12.02 වැනි දින සාදන ලද අංක 4748/1998 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කරන ලද ලොට් 5 ඒ නැමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි නානායක්කාර මාවත වරිපනම් අංක 181 ඒ 57සහ 181ඒ 57/1/1 දේපළ ඇතුළු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 7.75.

*දේපළට පිවිසීම.* - බොරැල්ල සිට දෙස්තර එන්. එම්. පෙරේරා මාවත ඔස්සේ රාජගිරිය දෙසට ගෝතමී මාවත දක්වා ගමන් ගෙන වමට හැරී එම මාවතේ හමුවන පාලම පසුකර බෝ ගහ දක්වා පැමිණ දකුණට හැරී ස්වල්ප දුරක් ගමන් ගෙන නැවත වමට හැරී කාසන්ස් කුලී වාහන සේවය (Casons Rent a Car Office) කාර්යාලය දක්වා පැමිණ වටම හැරී ස්වල්ප දුරක් ගමන් ගෙන දකුණට හැරී මීටර් 15ක් පමණ ගමන් ගත් විට මෙම පාරේ දකුණු පසින් අදළ දේපළ පිහිටා තිබේ.

මෙම දේපළ වී 2 ප්‍රොපටි මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2017 ජනවාරි මස 30 වැනි දින පෙ. ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2014.08.29 වැනි දින රජයේ ගැසට් පත්‍රයද, 2014.09.05 වැනි දින ලක්බිම, ඩේලිමිරර් හා තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ජ්‍යෙෂ්ඨ කළමනාකරු තැන (අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී බී ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක 011-2661835, 011-2661836, 011-2661826.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ,
මහනුවර.
දුරකථන අංකය : 081-2210595/071-4755974/071-8446374.

01-96

---

**සෙලාන් බැංකුව පීඑල්සී - ගලෙන්බිඳුණුවැව ශාඛාව**

**1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

මෙම දේපළ ගලෙන්බිඳුණුවැව පදිංචි රත්නායක මුදියන්සේලාගේ ධනුෂ්ක දිලිප් රත්නායක යන අය බන්ධනදයි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරලේ, මහරගම නගර සභා සීමාව තුළ, මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සීමාව තුළ නාවින්න 527 ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ නාවින්න පිහිටි බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් සාදන ලද 2014.03.14 දිනැති අංක 3219 ඒ දරන සැලැස්මේ නිරූපනය වන ගොරකගහවත්ත නමැති ඉඩමේ ලොට් 1 ඒ ලකුණු කළ (බලයලත් මිනින්දෝරු ඩී.කපුගීකියන විසින් සාදන ලද 1999.07.16 දිනැති අංක 4887 දරන සැලැස්මේ නිරූපනය වන එකතු කළ ලොට් 1 ඒ සහ 1 බී හි නැවත මැනීමක් වන) බෙද වෙන් කරන ලද ඉඩම් කැබැල්ල එකී අංක 3219ඒ සැලැස්ම අනුව පර්චස් විස්සයි දශම නවයයි පහක් (අ. 0 රූ. 0 පර්. 20.95) ක් නොහොත් හෙක්ටයාර් 0.05299 ක් විශාල ඉඩම.

පහත සඳහන් ලොට් 1 ඩී උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

පෙර කී මහරගම නගර සභා සීමාව තුළ සහ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සීමාව තුළ නාවින්න - 527 ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ නාවින්න පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන විසින් සාදන ලද 1999 ජුලි මස 16 දිනැති අංක 4887 දරන සැලැස්මේ නිරූපනය වන ගොරකගහවත්ත නමැති ඉඩමේ ලොට් 1 ඩී ලකුණු කළ ඉඩම් කැබැල්ල එකී අංක 4887 දරන සැලැස්ම අනුව පර්චස් දෙකයි දශම පහයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 2.50)ක් විශාල ඉඩම.

අංක 3219 ඒ දරන සැලැස්මේ සඳහන් එකී ලොට් 1 ඒ පහත සඳහන් ඉඩම් වල එකතු ලද කොටසකි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ සල්පිටි කෝරලේ මහරගම නගර සභා සීමාව තුළ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාව තුළ නාවින්න - 527 ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ නාවින්න පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන විසින් සාදන ලද 1999 ජුලි 16 දිනැති අංක 4887 දරන සැලැස්මේ නිරූපණය වන ගොරකගහවත්ත නමැති ඉඩමේ ලොට් 1 ඒ ලකුණු කළ ඉඩම් කැබැල්ල, එකී අංක 4887 සැලැස්ම අනුව පර්චස් දහයයි දශම පහයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 10.50) ක් විශාල ගස්,වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ සල්පිටි කෝරලේ මහරගම නගර සභා සීමාව තුළ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාව තුළ නාවින්න - 527 ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ නාවින්න පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන විසින් සාදන ලද 1999 ජුලි 16 දිනැති අංක 4887 දරන සැලැස්මේ නිරූපණය වන ගොරකගහවත්ත නමැති ඉඩමේ ලොට් 1 බී ලකුණු කළ ඉඩම් කැබැල්ල, එකී අංක 4887 සැලැස්මේ නිරූපණය වන ගොරකගහවත්ත නමැති ඉඩමේ ලොට් 1බී ලකුණු කළ ඉඩම් කැබැල්ල එකී අංක 4887 සැලැස්ම අනුව පර්චස් දහයයි දශම පහයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 10.50)ක් විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2017 ජනවාරි මස 25 වැනි දින පෙරවරු 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - මහරගම නගරයේ සිට හයිලෙවල් පාර ඔස්සේ කොළඹ දෙසට කි. මී. 1 1/2ක පමණ දුරක් ගොස් නාවින්න මංසන්ධිය දක්වා පැමිණ දකුණුපසට ඇති ශ්‍රී දේවානන්ද පාරට හැරෙන්න. එම මාර්ගය ඔස්සේ තවත් මීටර් 50 ක පමණ දුරක් ගිය විට වම්පසට ඇති වට මාවත හමුවේ. එම වට මාවත දිගේ තවත් මීටර් 50 ක පමණ දුරක් ගිය විට වංගුවක් හමුවේ. එම වංගුව අසළින් දේපළට පිවිසෙන මාර්ගය පිහිටා ඇත. එම දේපළට පිවිසෙන මාර්ගය ඔස්සේ තවත් මීටර් 15 ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ එම මාර්ගය අවසානයේ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - රජයේ ගැසට් පත්‍රයේ 2016.11.25 වැනි දින පළ වී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2016.11.21 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2016.11.18 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1%(සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම්, ගැණුම් මිලෙන් ඉතිරි 90% විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011 2456473, 2456480.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011 3068185, 011 2572940.

01-97

---

**පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී. - ගම්පොල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ වර්ෂ 2017ක් වූ පෙබරවාරි මස 02 වැනි දින පෙ. ව. 10.30ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මධ්‍යම පළාතේ, (මහනුවර ලියාපදිංචි කොට්ඨාසය තුළ) මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බටුපිටිය ග්‍රාමසේවා වසමට අයත් බටුපිටිය පිහිටි ''ගුරුපහුරේ හේන'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් මැන සාදන ලද 1997.04.20 දිනැති 2014.10.14 දින සටහන් තබා ඇති) අංක 6997 ඒ දරන පිඹුරෙහි ලොට් 10 ඉඩම.

විශාලත්වය : අ. 0 රූ. 0 පර්. 27.6

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එන්. වැගොඩපොල විසින් සහතික කරන ලද වර්ෂ 2015.03.19 වැනි දිනැති අංක 1390 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදු කිරීම, මොහමඩ් රෆීක් මොහමඩ් මවුජූඩ් බන්ධනදයි/උකස්කරු ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද, යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2016.12.16 දින දරන ගැසට් පත සහ ඩේයිලි නිවුස්, ලක්බිම, තිනකුරල් පුවත්පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - ගෙලිඔය කඩවීදියේ සිට දවුලාගල හරස් පාර ඔස්සේ බූවැලිකඩ හන්දිය දක්වා පැමිණෙන්න. එතැනින් වමට ඇති වටදෙණිය පාරෙන් හැරී තව මීටර් 400ක් ඉදිරියට එන විට (අංක 3/4 ලෙස සලකුණු කරන ලද බෝක්කුව හමුවේ) එතැනින් වමට ඇති කොන්ක්‍රීට් කර ඇති බටුපිටිය පාරට හැරී මීටර් 100 ක් යන විට මෙම ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් වියදම් මුදල් වලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(1) ගැණුම් මුදලෙන් 10%ක් ද, (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5%ක් ද (සියයට දෙකහමාරක්) ,
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදල හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදල තොරතුරු සඳහා කළමණාකරු ණය අයකර ගැනීම් අංශය පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී ප්‍රධාන කාර්යාලය අංක 450 ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011-4667227/011-2565573.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු සහ
බලයලත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක : 0718446374, 0777761706
ෆැක්ස් අංකය : 08112210595.

01-126

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්. සී.
විදේශීය ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියේ විකිණීම

**පළමුවන උපලේඛනය**

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, රම්බොඩ කෝරළේ රම්බොඩ ගමේ හි පිහිටි දූන් වෙදමුල්ල වතුයාය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඥාණප්‍රකාසම් විසින් 1990 මැයි/ඔක්තෝබර් මස සාදන ලද අංක 2811 සහ 1990 සැප්තැම්බර් මස සාදන ලද අංක 2812 දරන පිඹුරෙන් බෙද වෙන් කොට ඇති සියලු ඉඩම් වතු සහ පරිශ්‍රයන්,

ප්‍රමාණය හෙක්ටයාර් හාරසිය පනස් හතරයි දශම තුනයි දෙකයි නමයක් (හෙක්ටයාර් 454.329) හෙවත් අක්කර එක්දහස් එකසිය විසි දෙකයි පර්චස් තිහයි දශම අටයි දෙක
(අ. 1122, රූ. 0, පර්. 30.82)

*(a)* ඉහත සඳහන් රම්බොඩ ගමෙ හි පිහිටි පිඹුරු අංක 2811 හි දැක්වෙන ලිලීස් වතු කොටසේ අංක 21ඒ හැර වෙදමුල්ල වතුයායේ යාබද ඉඩම් වන රම්බොඩ ඉඩම් කොටස ලිලීස් ඉඩම් කොටස සහ වෙදමුල්ල ඉඩම් එකතුව,

ප්‍රමාණය හෙක්ටයාර් දෙසිය පනස් නමයයි දශම බිංදුවයි දෙකක් (හෙක්ටයාර් 259.02) හෙවත් අක්කර හයසිය තිස් නමයයි රූඩ් තුනයි පර්චස් හතරයි දශම හතක (අ. 639 රූ. 3 පර්. 4.7)

*(b)* ඉහත සඳහන් රම්බොඩ ගමෙ හි පිහිටි පිඹුරු අංක 2811 හි දැක්වෙන වෙදමුල්ල වතුයායේ ඉඩම් කොටස් අංක 21 ඒ

ප්‍රමාණය හෙක්ටයාර් හතයි දශම පහයි හතරයි තුනක් (හෙක්ටයාර් 7.543) හෙවත් අක්කර දහඅටයි රූඩ් දෙකයි පර්චස් විස්සයි දශම නමයයි නමයක් (අ. 18, රූ. 2, පර්. 20.99)

*(c)* ඉහත සඳහන් රම්බොඩ ගමෙ හි පිහිටි පිඹුරු අංක 2811 හි දැක්වෙන වෙදමුල්ල වතුයායේ කැම්නෙදන් කොටසට අයත් මුළු ඉඩම.

ප්‍රමාණය හෙක්ටයාර් එකසිය හතලිස් හතයි දශම බිංදුවයි පහක් (හෙක්ටයාර් 147.05) හෙවත් අක්කර තුන්සිය හැට තුනයි පර්චස් තිස්හයයි දශම නමයයි දෙකක (අ. 363 රූ. 0 පර්. 36.92)

*(d)* ඉහත සඳහන් රම්බොඩ ගමේ හි පිහිටි පිඹුරු අංක 2812 හි දැක්වෙන වෙදමුල්ල වතුයායේ තවලම්තැන්න කොටසේ වතු අංක 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස.

ප්‍රමාණය හෙක්ටයාර් හතරයි දශම හයයි අටයි පහක් (හෙක්ටයාර් 4.685) හෙවත් අක්කර එකොළහයි රූඩ් දෙකයි පර්චස් එකොළහයි දශම පහයි එකක
(අ. 11, රූ. 2, පර්. 11.51)

*(e)* ඉහත සඳහන් රම්බොඩ ගමේ හි පිහිටි පිඹුරු අංක 2812 හි දැක්වෙන වෙදමුල්ල වතුයායේ වැවැන්ඩන් කොටසේ වතු අංක 6, 8A, 8B, 10B සහ 12B වශයෙන් හඳුන්වන මුළු ඉඩම් කොටස.

ප්‍රමාණය හෙක්ටයාර් විසි පහයි දශම හතරයි අටක් (හෙක්ටයාර් 25.48) හෙවත් අක්කර හැටදෙකයි රූඩ් තුනයි පර්චස් තිස්දෙකයි දශම හතරයි හයක (අ. 62, රූ. 3, පර්. 32.46)

*(f)* ඉහත සඳහන් රම්බොඩ ගමේ හි පිහිටි පිඹුරු අංක 2812 හි දැක්වෙන වෙදමුල්ල වතුයායේ වැවැන්ඩන් කොටසේ වතු අංක 13, 14, සහ 15 වශයෙන් හඳුන්වන මුළු ඉඩම් කොටස.

ප්‍රමාණය හෙක්ටයාර් දහසයයි දශම පහයි දෙකක් (හෙක්ටයාර් 16.52) හෙවත් අක්කර හතලිහයි රූඩ් තුනයි පර්චස් අටයි දශම හතක් (අ. 40, රූ. 3, පර්. 8.7)

*(g)* ඉහත සඳහන් රම්බොඩ ගමේ හි පිහිටි පිඹුරු අංක 2812 හි දැක්වෙන වෙදමුල්ල වතුයායේ වැවැන්ඩන් කොටසේ වතු අංක 16 වශයෙන් හඳුන්වන මුළු ඉඩම් කොටස.

ප්‍රමාණයෙන් හෙක්ටයාර් එකයි දශම පහයි හයයි බිංදුවක් (හෙක්ටයාර් 1.560) හෙවත් අක්කර තුනයි රූඩ් තුනයි පර්චස් දහසයයි දශම පහයි එකක් (අ. 3, රූ. 3, පර්. 16.51).

ශ්‍රී ලංකා රජය යටතේ සංස්ථාපිත නිත්‍යානුකූල සමාගමක් වන කොළඹ 08, ඥණාර්ත ප්‍රදීප මාවතේ, අංක 10, දරන තැන ලියාපදිංචි කාර්යාලය පිහිටි අගලවත්ත ප්ලාන්ටේෂන්ස් පී. එල්. සී. (කලින් හැඳින්වූ අගලවත්ත ප්ලාන්ටේෂනස් ලිමිටඩ්) ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට ඉහත 1 වන උපලේඛනයේ සඳහන් දේපළ උකස් කර ඇත.

පළමුවන උපලේඛනයේ සඳහන් දේපළ (වෙදමුල්ල වතුයාය) (අ. 1122, රූ. 0, පර්. 30.82)

*a* - (අ. 639, රූ. 3, පර්. 4.7)

*b* - (අ. 18, රූ. 2, පර්. 20.99)

*c* - (අ. 363, රූ. 0, පර්. 36.92)

*d* - (අ. 11, රූ. 2, පර්. 11.51)

*e* - (අ. 62, රූ. 3, පර්. 32.46)

*f* - (අ. 40, රූ. 3, පර්. 8.7)

*g* - (අ. 3, රූ. 3, පර්. 16.51)

වර්ෂ 2017ක් වූ ජනවාරි මස 23 වැනි දින ප. ව. 2.00 ට ඉහත ස්ථානවල දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.10.21 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද 2016.10.24 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2017.01.06 වැනි දින රජයේ *ගැසට් පත්‍රය*, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*දේපළ වෙත පිවිසීම.* - පේරාදෙණිය බසාර් සිට නුවරඑළිය ප්‍රධාන පාරේ. කි. මී. 50.50 ගමන් කර (බෝක්කු අංක 50/11) රමම්බොඩ ගමට පැමිණ එතැනින් වමට හැරුණු විට ඇති මෝටර් වාහන ගමන් කළ හැකි වතුයාය පාරේ මීටර් 600ක් ඉදිරියට ගිය විට වතුයාය කාර්යාලයට අදාළ දේපළට පිවිසිය හැකිය.

(01) ගැනුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතු ය. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ විදේශීය ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී.සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වැනි මහල,
උසාවි පාර, කොළඹ 12.
දුරකතන/ෆැක්ස් අංක : 011-2445393
ඊමේල් : senaservice@sltent.lk

ජ්‍යෙෂ්ඨ කළමණාකරු (අයකිරීම්),
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.,
අංක 21,
සර් රාසික් ෆරීඩ් මාවත, කොළඹ 01.
දුරකතන අංකය : 011-2486767
ෆැක්ස් අංකය : 011-2347717.

01-152

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්. සී. - වැලිගම ශාඛාව

